## දර්ශනපති (M.Phil) (පූර්ණකාලීන)
### පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය - සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

**(අ.) පාඨමාලා කාලසීමාව**

දෘශ්‍ය හා ප්‍රාසංගික කලා දර්ශනපති (M.Phil) උපාධිය සඳහා වන නිත්‍ය කාල සීමාව පූර්ණ කාලීනව අවුරුදු 02 කි.

කිසියම් අපේක්ෂකයෙකුට පිළිගත හැකි හේතු මත කාලසීමාව දීර්ඝ කර ගැනීමට අවශ්‍ය වුවහොත් එසේ දීර්ඝ කර ගත හැකි උපරිම කාලසීමාව වන්නේ ප්‍රථම වරට ලියාපදිංචි වූ දින සිට වසර 04 කි.

**(ආ.) ඇතුළත්වීමේ සුදුසුකම්**

පහතින් දක්වා ඇති විෂයයන්ගෙන් ලබාගත් ප්‍රථම හෝ දෙවන පෙළ පන්ති සාමාර්ථ්‍යයක් ලබා තිබීම. (අවම GPA අගය 3.0 සහ පාඨමාලා සම්භාර 120) හෝ පහතින් දක්වා ඇති විෂයයෙගෙන් ලබාගත් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් සහ පිළිගත් ලාංකීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම.

1. කලා ඉතිහාසය හා කලා සැළසුම් පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (BA in Art History & Design)
2. සංස්කෘතික ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (BA in Cultural History)
3. ලලිත කලාවේදී උපාධිය (BFA)
4. ව්‍යවහාරික කලාවේදී උපාධිය (Bachelor of Applied Arts)
5. සැළසුම්වේදී උපාධිය (B.Des)
6. දෘශ්‍ය කලාවේදී උපාධිය (BVA)
7. සංගීතවේදී උපාධිය (B.Mus)
8. නර්තනවේදී උපාධිය (B.Dan)
9. ප්‍රාසංගික කලාවේදී උපාධිය (BPA)

හෝ ඊට සමාන්තර වෙනත් උපාධියක්

(ඉහත ආයතනික අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති එහෙත් පර්යේෂණාත්මක, නිර්මාණාත්මක හා අදාළ විෂය ක්ෂේත්‍රයේ වෘත්තීය මට්ටමේ ජාතික හා ජාත්‍යන්තර පිළිගැනීම් සහිත සුවිශේෂ කාර්යයක් ඉටු කර ඇති අයදුම්කරුවන්ටද ඉල්ලුම් කළ හැක. එය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ නිර්දේශය හා සනාතන සභාවේ අනුමැතිය මත සිදු විය යුතුය.)

**(ඇ.) අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය හා තෝරා ගැනීම**

සියලු අයදුම්කරුවන් ඉහතින් දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් පරිදි අදාළ ලිපි ලේඛන සමඟ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට භාරදිය යුතුය.

1. ක්ෂේත්‍රයේ නිරත ප්‍රවීණයන් දෙදෙනෙකු විසින් අයදුම්කරුගේ විෂය ක්ෂේත්‍රයට ඇති දක්ෂතාවය හා හැකියාව පිළිබඳව අයදුම්පතේ සහතික කර තිබිය යුතුය.
2. අයදුම්කරුට තම අභිමතය පරිදි විෂය ප්‍රවීණයින් දෙදෙනෙකු උපදේශකවරුන් ලෙස නම් කළ හැකිය. (උක්ත උපදේශකවරුන් දර්ශනපති හෝ දර්ශනසූරී උපාධිය සහිත මහාචාර්යවරු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් විය යුතුයි.) උපදේශකවරුන් සම්බන්ධ අවසන් තීරණය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ මණ්ඩලය සහ සනාතන සභාව සතුය.
3. සෑම අයදුම්කරුවෙකුම තම පශ්චාද් උපාධි සහ ප්‍රථම උපාධිය සම්බන්ධ විස්තරාත්මක නිළ අධ්‍යාපන සහතික පිටපත් අයදුම් පත්‍රයට ඇමිණිය යුතුය.
4. අයදුම් පත්‍රය සමග ස්වකීය කාර්ය සාධනය, පර්යේෂණ හා නිර්මාණ ආදී විස්තර ඇතුළත් ජීවදත්ත විස්තර ඉදිරිපත් කළ යුතුය. මෙය හැකි තරම් කෙටි ලේඛනයකින් ඉදිරිපත් කළ යුතුය.
5. අයදුම්කරු විසින් ස්වකීය පර්යේෂණය පිළිබඳ සම්පිණ්ඩනයක්; (Synopses) ඉදිරිපත් කළ යුතුය. එය පර්යේෂණ මාතෘකාව, පර්යේෂණය පිළිබඳ හැඳින්වීම, පර්යේෂණ පරමාර්ථ, පර්යේෂණ ගැටළුව, උපන්‍යාස, පර්යේෂණ සැළැස්ම (පරිච්ඡේද වෙන්කිරීම) හා ජීවමූලාශ්‍ර (Bibliography) ඇතුළත්ව සකස් විය යුතුය. (ආසන්න ලෙස A4 ප්‍රමාණයේ පිටු 05 ක්)
6. අවශ්‍ය වූ විට පර්යේෂණය සඳහා අයවැය විස්තරයක් ඉදිරිපත් කළ යුතුය.
7. යෝජිත දර්ශනපති උපාධිය කලින් දැනුම් දීම මත පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ මණ්ඩලයේ නිර්දේශය මත සනාතන සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් දේශීය හෝ විදේශීය ආයතනයක ද සම්පූර්ණයෙන් හෝ කොටසක් ලෙස සිදු කළ හැකිය.
8. පශ්චාද් උපාධිය සඳහා තෝරාගත් අයදුම්කරුවන්ට ඒ බව ලියාපදිංචි තැපැල මඟින් දැනුම් දෙනු ලැබේ.

**(ඈ.) ලියාපදිංචිය**

1. ලියාපදිංචිවීමට පෙර පශ්චාද් උපාධි අපේක්ෂක මාතෘකාව හා පර්යේෂණ යෝජනාව පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයෙන් අනුමත විය යුතුය.
2. එසේ පීඨ මණ්ඩල නිර්දේශය හා සනාතන සභාවේ අනුමැතිය ලැබූ අපේක්ෂකයෙකුට මාස 06 ක් ඇතුළත දී දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි විය හැක.
3. ඉන් පසු එළඹෙන සෑම වසරකට වරක්ම ලියාපදිංචිය අලුත් කළ යුතුය.
4. පිළිගත හැකි හේතුවක් නොමැතිව නියමිත දින පසු වී මාස 03 ක් ඇතුළත ලියාපදිංචිය අලුත් කර නොගන්නා අපේක්ෂකයින් සිය ලියාපදිංචිය ස්වේච්ඡාවෙන්ම ඉවත් කරගත්තා සේ සැළකේ.

**(ඉ.) ලියාපදිංචිය අවලංගුවීම**

1. ලියාපදිංචි ගාස්තු හා අදාළ අනෙකුත් ගාස්තු නියමිත දින සිට මාස 03 ක් ඇතුළත නොගෙවීම.
2. පාඨමාලාව සඳහා නියමිත උපරිම කාල සීමාව ඉක්මවීම.
3. අඛණ්ඩව ප්‍රගති වාර්තා දෙකක් ඉදිරිපත් නොකිරීම.
4. විශ්වවිද්‍යාලයේ නීතිරීති උල්ලංඝනය කිරීම.
5. අධ්‍යයන කටයුතු අසතුටුදායක වීම.

**(ඊ.) දර්ශනපති පාඨමාලාව දර්ශනසූරී (PhD) උපාධි පාඨමාලාව දක්වා උත්තීර්ණ කිරීම**

දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වී ඇති විද්‍යාර්ථියෙක් පහතින් දක්වා ඇති සුදුසුකම් සපුරාලන්නේ නම් පමණක් ලියාපදිංචියේ පළමු වසර ඇතුළත ඔහුගේ/ ඇයගේ නිබන්ධය දර්ශනසූරී උපාධිය දක්වා උත්තීර්ණ කර ගත හැකිය.

1. ප්‍රථම උපාධිය සඳහා ප්‍රථම පෙළ පන්ති සාමාර්ථයක් ලබා තිබීම.
2. දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වී ප්‍රථම වසර ඇතුළත නියමිත සම්මන්ත්‍රණ 02 සාර්ථකව නිම කර තිබීම. (මාතෘකාව අනුමත කර ගැනීම, සාහිත්‍යයික සමීක්ෂාව)
3. විද්‍යාර්ථියාගේ පර්යේෂණ නිබන්ධයේ ඒ වන විට අවසන් කොට ඇති ප්‍රමාණයේ ගුණාත්මකභාවය. අවම වශයෙන් පරිච්ඡේද 02 වත් ඇගයීම සඳහා ඉදිරිපත් කළ යුතුයි.
4. උපදේශකවරුන්ගේ සහ අධ්‍යයන මණ්ඩලයේ (Study Board) නිර්දේශය
5. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන් පිටත මහාචාර්යවරුන් දෙදෙනෙකු විසින් කරනු ලබන ඇගයීම (මෙම මහාචාර්යවරුන් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ මණ්ඩලයේ නිර්දේශය මත සනාතන සභාව විසින් පත් කළ යුතුය.)
6. අපේක්ෂකයා විසින් පශ්චාද් උපාධි පීඨයෙන් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි.
7. ඉහත සුදුසුකම් සපුරන අපේක්ෂකයින් සඳහා දර්ශනපති උපාධි පාඨමාලාවට නියමිත වසර දෙකට අමතරව තවත් එක් වසරක් සඳහා ලියාපදිංචි වීමට අවස්ථාව ලැබෙන අතර එතැන් පටන් එකී පර්යේෂණය දර්ශනසූරී උපාධි පාඨමාලාවක් සේ සලකනු ලැබේ. ඒ අනුව පළමු වසරේ සිට කරගෙන ආ පර්යේෂණ කටයුතු දර්ශනසූරී උපාධියක මට්ටමෙන් ඉතිරි වසර දෙක ඇතුළත අපේක්ෂකයා විසින් අවසන් කළ යුතුය.
8. එසේ අවස්ථාව ලබාදීමෙන් පසු සම්පූර්ණ වසර තුනක් තුළ පර්යේෂණ නිබන්ධය අවසන් කිරීමට නොහැකි වුවහොත් හෝ ප්‍රගතිය අභිමත ශාස්ත්‍රීය මට්ටමක නොමැති නම් ප්‍රදානය කර ඇති දර්ශනසූරී (PhD) පාඨමාලාව නැවතත් දර්ශනපති (M.Phil) උපාධි පාඨමාලාවේ තත්වයට පත්වනු ඇත.

**(උ.) පාඨමාලාව සඳහා ලියාපදිංචි ගාස්තු**

ගෙවන ලද පාඨමාලා ගාස්තු සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.

දර්ශනපති (M.Phil) - රු. 70,000/- (දේශීය අපේක්ෂකයකු සඳහා)

ඒ ඒ අධ්‍යයන වර්ෂයන්වලදී කාලානුරූපීව පාඨමාලා ගාස්තු සංශෝධනය විය හැකි ය.

**දෑවුරුදු දර්ශනපති උපාධිය (පූර්ණ කාලීන පර්යේෂණ)**

**<u>ප්‍රථම ලියාපදිංචිය</u>**

| | |
|---|---|
| ලියාපදිංචි ගාස්තු (වාර්ෂික) | - රු. 10000.00 |
| උපදේශන ගාස්තු (වාර්ෂික) | - රු. 10000.00 |
| පුස්තකාල ගාස්තු | - රු. 2500.00 |
| කාර්යාලයීය සහ ලිපි ද්‍රව්‍ය ගාස්තු | - රු. 2000.00 |
| ප්‍රථම ලියාපදිංචිය සඳහා මුළු ගාස්තුව | - රු. 24500.00 |

**<u>දෙවන වසරේ සිට</u>**

| | |
|---|---|
| ලියාපදිංචි ගාස්තු (වාර්ෂික) | - රු. 10000.00 |
| උපදේශන ගාස්තු (වාර්ෂික) | - රු. 10000.00 |
| විභාග ගාස්තු | - රු. 10000.00 |
| නිබන්ධ ඇගැයීමේ ගාස්තු (පරීක්ෂකවරු 02) | - රු. 8000.00 |
| කාර්යාලයීය සහ ලිපි ද්‍රව්‍ය ගාස්තු | - රු. 7500.00 |
| දෙවන වසර සඳහා මුළු ගාස්තුව | - රු. 45500.00 |

**සම්පූර්ණ පාඨමාලා ගාස්තුව - රු. 70,000.00**

විදේශීය ශිෂ්‍යයන්ගේ ගාස්තු විශ්වවිද්‍යාල මඟින් වාර්ෂිකව දැනුම් දෙනු ලැබේ.

**(ඌ.) පර්යේෂණ උපාංග**

දර්ශනපති උපාධි අපේක්ෂකයන් විසින් පහත පර්යේෂණ උපාංග සපුරා තිබිය යුතුයි. නිබන්ධය ඉදිරිපත් කරනු ලබන භාෂා මාධ්‍ය පිළිබඳ ප්‍රවීණත්වය, පර්යේෂණ ක්‍රමවිද්‍යාව, සංඛ්‍යානය සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම.

**(එ.) පර්යේෂණයේ ප්‍රගතිය**

1. තම උපදේශකවරුන් සමග පර්යේෂණ කාර්යෙහි නිරන්තර සම්බන්ධතා පැවැත්වීම අපේක්ෂකයාගේ වගකීම වන්නේය. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් උපදේශකවරුන් හා සිසුන් මුණ ගැසීම සඳහා මසකට වරක් අවස්ථාව ලබාදෙනු ලැබේ. එම මාසික ප්‍රගති වාර්තාව පීඨ මණ්ඩලයේ සභාගත වනු ඇත.

2. අපේක්ෂකයා සිය පර්යේෂණයේ වාර්ෂික ප්‍රගතිය නිබන්ධ උපදේශකවරුන් මඟින් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි.
3. සෑම අපේක්ෂකයෙක්ම ලියාපදිංචි වී ප්‍රථම වසර ඇතුළත සම්මන්ත්‍රණ දෙකක් එනම්, පශ්චාද් උපාධි මාතෘකාව අනුමත කර ගැනීම හා සාහිත්‍යයික සමීක්ෂා යන සම්මන්ත්‍රණ පැවැත්විය යුතුයි. මෙම සම්මන්ත්‍රණ පැවැත්වීම පිළිබඳ වැඩි විස්තර පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයෙන් ලබාගත හැක. උක්ත සම්මන්ත්‍රණ දෙක පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් නියම කරනු ලබන දිනයක දී පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ පැවැත්විය යුතුය. (මෙම පරීක්ෂණ මණ්ඩලය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති, අදාළ පීඨයේ පීඨාධිපති, උපදේශකවරුන් හා සම්මන්ත්‍රණ පරීක්ෂකවරයෙකුගෙන් සමන්විත වේ.)
4. සිය දර්ශනපති උපාධිය හදාරණ කාලය තුළ සෑම අපේක්ෂකයෙකු විසින්ම සාර සංග්‍රහ දෙකක් (Abstract) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල පර්යේෂණ පරිසංවාදයට හෝ වෙනත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයකට ඉදිරිපත් කොට ඒ බව පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට වාර්තා කළ යුතුය.

**(ඒ.) නිබන්ධයේ ආකෘතිය**

1. පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලය විසින් අනුමත භාෂා මාධ්‍යයෙන් නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුය.
2. නිබන්ධයේ අගය වචන සංඛ්‍යාව මත රඳා නොපවතී. පර්යේෂකයා විසින් සිය පර්යේෂණ කාර්යය සඳහා දක්වන විශේෂත්වය උපදේශකවරුන් විසින් හඳුනාගැනීමත්, පර්යේෂකයා විසින් සිය නිබන්ධය උදෙසා පවත්වාගෙන යනු ලබන ඉහළ ශාස්ත්‍රීය මට්ටමත් මත පර්යේෂණ නිබන්ධයේ ඇගයීම රඳාපවතී.
3. නිබන්ධයේ වචන සංඛ්‍යාව 25000 ට නොඅඩු විය යුතු අතර නිබන්ධය 80 GSM A4 ප්‍රමාණයේ කඩදාසියෙහි පරිගණක අක්ෂරය සිංහලෙන් නම් FM අභය පොයින්ට් 12 ප්‍රමාණයට ද ඉංග්‍රීසියෙන් නම් Times New Roman 12 Point අකුරෙන් ද මුද්‍රණය කර තිබිය යුතුය.
4. නිබන්ධයේ ඇතුළත පිටු සැකැස්ම පහත සඳහන් පරිදි සිදුවිය යුතුයි.
   මාතෘකාව පොයින්ට් 18 Bold
   පරිච්ඡේද මාතෘකාව පොයින්ට් 14 Bold
   පරිච්ඡේදය යනුවෙන් යෙදීම පොයින්ට් 12 Bold
   අනුමාතෘකාව පොයින්ට් 14
   නිබන්ධයේ පේළි අතර පරතරය 1.5 විය යුතුය.
   අධෝ ලිපි (Foot Note) පොයින්ට් 10 (ග්‍රන්ථ නාමය Italic කළ යුතුය.) පාදක සටහන් අතර පරතරය 1.0 විය යුතුය.
   පිටුවක වම් පස සහ ඉහළ සෙ.මී.4 ක හිස් තීරුවකින් යුක්ත විය යුතු අතර පිටුවේ පහළ සහ දකුණු පස සෙ.මී. 2.5 ක හිස් තීරුවකින් යුක්ත විය යුතුය.

5. නිබන්ධයෙහි ඇතුළත ප්‍රථම පිටුවෙහි නිබන්ධ මාතෘකාව, අපේක්ෂකයාගේ නම, ලේඛ්‍යාරූඪ අංකය, පීඨය සහ විශ්වවිද්‍යාලයේ නම නිබන්ධය ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලාව, ඉදිරිපත් කරනු ලබන වර්ෂය හා මාසය ද මුද්‍රණය කළ යුතුය.
6. දෙවන පිටුවෙහි අදාළ නිබන්ධයෙහි ඇතුළත් කොට තිබෙන කරුණු ස්වාධීන සොයා ගැනීම් බවත්, එම කරුණු මෙම විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් විශ්වවිද්‍යාලයක වෙනත් උපාධියක් සඳහා ඉදිරිපත් නොකළ බවත් දක්වෙන අපේක්ෂකයාගේ ප්‍රකාශයක් නිබන්ධ උපදේශකවරයාගේ සහතිකය සමඟ ඇතුළත් කළ යුතු ය.
   නිබන්ධයේ ආරම්භයට වචන 500 කට නොවැඩි සාරසංග්‍රහයක් (Abstract) ඇතුළත් විය යුතු ය.
7. අපේක්ෂකයා සිය නිබන්ධයේ අධෝ ලිපි, රූප සටහන් සහ වගු අංක කිරීමේදී සහ ආශ්‍රිත ග්‍රන්ථ ලේඛනය (Bibliography) ඉදිරිපත් කිරීමේදී අදාළ උපදේශකවරයාගේ සහ අධ්‍යයන මණ්ඩල අනුමත කරනු ලැබූ උපදෙස්වලට අනුකූලව හා තෝරාගත් පර්යේෂණ විධි ක්‍රමයකට අනුව සකස් කිරීමට වග බලාගත යුතු ය.

**(ඔ.) නිබන්ධය ඉදිරිපත් කිරීම**

1. අපේක්ෂකයා සිය නිබන්ධයෙහි දඟර බැඳි (Spiral - Bound) පිටපත් 02 ක් සිය උපදේශකවරුන්ගේ අත්සන් සහිතව විභාග අංශය වෙත භාර දිය යුතුය.
   නිබන්ධය භාරදීමේ දී එම නිබන්ධය සැකසීම සඳහා නිරන්තරව තමාගේ උපදේශකත්වය ලබාගත් බවට නිබන්ධ උපදේශකවරයාගේ සහතිකය ද ඇතුළත් කළ යුතුය. එලෙස උපදේශකවරුන් විසින් සහතික නොකරන ලද නිබන්ධ විභාග අංශය විසින් භාරගනු නොලැබේ.
   එලෙස විභාග අංශයට භාරදුන් පිටපත් දෙක පශ්චාද් උපාධි අධ්‍යයන මණ්ඩලය මඟින් පත්කරනු ලබන පරීක්ෂකවරුන් දෙදෙනෙකු වෙත ඇගයීම සඳහා යොමු කෙරේ. මින් එක් පරීක්ෂකවරයෙකු බාහිර විය යුතුයි.
2. දර්ශනපති උපාධිය සම්භාර 60 කින් සමන්විත වේ. සෑම අපේක්ෂකයෙකු විසින්ම ඉහතින් දක්වා ඇති (එ.) හි අඩංගු අංක 1 සිට 4 දක්වා කරුණු සපුරාලිය යුතුය. (සම්මන්ත්‍රණ පත්‍රිකා සහ ඉදිරිපත් කිරීම් එකක් සඳහා සම්භාර 10 යි, එක් පර්යේෂණ සංක්ෂිප්තයක් හා එහි දීර්ඝ පත්‍රිකාව සඳහා සම්භාර 5 යි. නිබන්ධය සඳහා සම්භාර 30 යි.)
3. නිබන්ධය හා ඊට අදාළ පරීක්ෂක වාර්තා ලැබීමෙන් පසු අපේක්ෂකයා වාචික පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. එම වාචික පරීක්ෂණයෙන් පසු පරීක්ෂකවරුන් විසින් පහත නිර්දේශයන් දෙනු ලැබේ.
   I. නිබන්ධය ඒ ආකාරයෙන්ම යෝජිත උපාධිය සඳහා පිළිගැනීම.

හෝ

II. අඩුපාඩු වේ නම් ඒවා සකස් කිරීමට යටත්ව නිබන්ධය පිළිගැනීම.

හෝ

III. නිබන්ධය ප්‍රතික්ෂේප කිරීම

හෝ

IV. ඉදිරිපත් කරන ලද නිබන්ධය දර්ශනසූරී උපාධිය සඳහා උත්තීර්ණ කරන ලද්දක් නම් එය ගුණාත්මක වශයෙන් දර්ශනසූරී උපාධි මට්ටමේ නොවන කල්හී දර්ශනපති උපාධියක් සඳහා නිර්දේශ කරනු ලැබේ.

4. දඟර බැම්මෙන් බඳින ලද පිටපත් පරීක්ෂකවරුන් විසින් අනුමත කිරීමෙන් පසු ඉදිරිපත් කළ යුතු අවසාන නිබන්ධය පිටපත් 04 කින් යුක්තව සණ බැම්මෙන් (Hard Bound Form) භාරදිය යුතුය. අපේක්ෂකයාගේ විෂය පථය අයත් පීඨයට නියමිත වර්ණයෙන් කවරය සකස් විය යුතුය. **(නර්තන හා නාට්‍ය කලා පීඨය - තද නිල්, සංගීත පීඨය - තද කොළ, දෘශ්‍ය කලා පීඨය - තද රතු)** පොත් නාරටියේ (Spine) අපේක්ෂකයාගේ නම, උපාධි පාඨමාලාව සහ නිබන්ධනය ඉදිරිපත් කරන වර්ෂය රන් පැහැති අකුරින් මුද්‍රණය කළ යුතුය. නිබන්ධයේ කවර මුහුණතේ නිබන්ධයේ නම පොයින්ට් 18 න් ද, අපේක්ෂකයාගේ නම, ලියාපදිංචි අංකය, උපාධි පාඨමාලාව සහ විශ්වවිද්‍යාලයේ නම පොයින්ට් 14 න් මුද්‍රණය කළ යුතුය. මේ අකුරු සියල්ල රන්වන් පැහැයෙන් මුද්‍රණය විය යුතුය. මේ සඳහා අවශ්‍ය උපදෙස් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයෙන් සැපයේ.

5. අනුමත ආකෘතියට අනුව සකස් කරන ලද අවසන් නිබන්ධයේ පිටපත් 4 ක් සිය උපදේශකවරුන්ගේ නිර්දේශ සහිතව විභාග අංශය වෙත භාරදිය යුතුය. ඉන් එක් පිටපතක් දින මුද්‍රාව තබා නැවත අපේක්ෂකයා වෙත භාර දෙනු ලැබේ. ඉතිරි පිටපත් පශ්චාද් උපාධි පීඨයට, විභාග අංශයට සහ පුස්තකාලයට භාරදෙනු ලැබේ.

6. නිබන්ධයේ අවසන් මාතෘකාව නිබන්ධය ඉදිරිපත් කිරීමට මාස තුනකටවත් පෙර පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කළ යුතුය.

**(ඕ.) නිබන්ධය නැවත ඉදිරිපත් කිරීම**

අඩුපාඩු සකස් කිරීමට යටත්ව අනුමත වූ නිබන්ධයක් සුළු අඩුපාඩු නම් මාස 03 ක් ඇතුළත එය සකස් කොට භාරදිය යුතුය. ප්‍රධාන අඩුපාඩුකම් සඳහා මාස 06 සිට වසරක උපරිම කාලයක් ඒ සඳහා හිමි වේ. එසේ නැවත සකස් කරන ලද නිබන්ධ අපේක්ෂකයා විසින් පූර්වෝක්ත අඩුපාඩු නිසියාකාරව සකස් කර ඇති බවට උපදේශකවරුන් මඟින් සහතික කොට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයාගේ අත්සන ද ලබාගෙන අදාළ පිටපත් අපේක්ෂකයා විසින්ම විභාග අංශය වෙත භාරදිය යුතුයි. නිබන්ධය භාරදීමට නියමිත දින පසුවී කරනු ලබන භාරදීම් පිළිගනු නොලැබේ.

**(ක.) උපාධිය පිරිනැමීම**

නිබන්ධය උපාධිය සඳහා පිළිගැනීමෙන් පසු අපේක්ෂකයා වෙත සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය වෙතින් පිරිනමනු ලබන**"දර්ශනපති උපාධිය"** පිරිනමනු ලැබේ. (SLQF Exit Level: 11)

**(ඛ.) ලේඛන සොරාගැනීම**

බුද්ධිමය දේපළ නීතිය හා කතෘ අයිතිය පිළිබඳ නීති උපාධි අපේක්ෂකයින් විසින් රැකිය යුතුය. ලේඛන හා දෘශ්‍ය රූප සොරා ගැනීම සපුරා තහනම් ය. අපේක්ෂකයන්ගේ ලේඛන සියල්ල ඔවුන්ගේ ම විය යුතුය. අන් අයගේ කතෘත්වය සහිත සංකල්ප/ පරිච්ඡේද/ උදෘත සහ දෘශ්‍ය රූප වෙනත් ලේඛනවලින් ගන්නා කල්හි ඒවා නිසි ලෙස ලබාගත් මූලාශ්‍ර සහිතව දැක්විය යුතුය. එසේ නොකොට නිබන්ධනවලට වෙනත් ලේඛනවලින් ඉහත දැක්වූ කොටස් ඇතුළත් කිරීම ශාස්ත්‍රීය සදාචාරය උල්ලංඝනය කිරීමකි. මෙම රීති කඩකරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකුගේ නිබන්ධයක් **අසමත්** කාණ්ඩයට වැටෙනු ඇත. ලේඛන හා දෘශ්‍ය රූප සොරා ගැනීම විශ්වවිද්‍යාලයීය ගෞරවයට හානි කිරීමක් ලෙස සලකනු ලැබේ.

**(ග). ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය**

**A** විශිෂ්ට ශාස්ත්‍රීය කාර්යයක් ඉටුකර ඇත. විෂය පිළිබඳ පරිග්‍රහණය හා අර්ථ විවරණ තුළින් සියලු කොටස්වල ශාස්ත්‍රීය ප්‍රවීණත්වය විදහා දක්වයි.

**B+** ඉහළ මට්ටමේ පරිග්‍රහණයකි. අධ්‍යයනය තුළ ඉතා ඉහළ ශාස්ත්‍රීය හා බුද්ධිමය තත්වයකට ළඟාවී ඇත.

**B** සමස්තයක් ලෙස ඉහළ මට්ටමට ළඟාවී ඇත. අධ්‍යයනය තුළ ශාස්ත්‍රීය හා බුද්ධිමය කාර්යය සාක්ෂාත් කර තිබේ.

**C** පරිග්‍රහණය හා අවබෝධය පිළිගත හැකිය.

**F** අසමත්

**INC** අසම්පූර්ණ, නැවත සකස් කළ යුතු හා භාරනොදුන් යන්න සංකේතවත් කරයි. මේ අනුව නිරායාසයෙන්ම අසමත් කාණ්ඩයට වැටේ.

**NRP** ප්‍රගතිය පිළිබඳ වාර්තා නැත.

**W** ඉවත් කරගෙන තිබේ.

**(ස) පශ්චාද් උපාධි සඳහා**
**ශ්‍රේණිගත අගය**

| **ලකුණු** | **ශ්‍රේණිය** | **අගය** |
|---|---|---|
| **100 - 90** | **A** | **4.00** |
| **89 – 80** | **B+** | **3.67** |
| **79 - 75** | **B** | **3.33** |
| **74 – 70** | **C** | **3.00** |
| **69 – 00** | **F** | **2.67** |